# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DMS/Cir/04/2018
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.04. 11

කළමනාකරණ සේවා චක්‍රලේඛ : 02/2016 (II)

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කිරීම - 2016**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධානයන් යටතේ වැටුප් ගෙවනු ලබන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයට පහත සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීම සඳහා අංක අමප 18/0254/719/013 හා 2018.03.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී ඇත.

(I) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි 13 වගන්තිය යටතේ ඇති අතිකාල දීමනා සම්බන්ධ 13.2,13.3 සහ 13.4 උප වගන්ති ඉවත් කිරීම සහ පහත වගන්තිය ඇතුළත් කිරීම.

(අ) ව්‍යවස්ථාපිත නීතියක් මගින් සලසා ඇති ප්‍රතිපාදන අනුව අතිකාල දීමනා ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කරන ලද ආයතන විසින් ඒ අනුව කටයුතු කළ හැකි වන අතර එසේ නොමැතිව, ආයතන සංග්‍රහය තම පරිපාලන කටයුතු සඳහා යොදා ගන්නා ආයතන විසින් අතිකාල දීමනා ගෙවීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල කර ගත යුතුය.

(II) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි 20.1 උප වගන්තිය අවසානයට පහත වගන්තිය ඇතුළත් කිරීම.

(අ) යම් සේවකයෙකු 2015.12.31 දිනට ලබමින් සිටි සංයුක්ත දීමනාවේ මූල්‍යමය අගය හා කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 ට අනුව ගණනය කිරීමේ දී ලබන මූල්‍යමය අගයෙන් වැඩි මූල්‍යමය අගයක් සහිත සංයුක්ත දීමනාව එම සේවකයාට පෞද්ගලික වන සේ ලබාදිය යුතුය.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව